# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## ඒකක පරීක්ෂණය

| 11 ශ්‍රේණිය | ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය | 2, 3 ඒකක |
|---|---|---|

## කළමනාකරණය / අලෙවිකරණය

- **අංක 01 සිට 06 දක්වා දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.**

01. අවම සම්පත් ප්‍රමාණයකින් උපරිම ප්‍රයෝජන ලැබෙන පරිදි සම්පත් භාවිතා කිරීම,

(1). සංවිධානකරණයයි (3). කාර්යක්ෂමතාවයයි
(2). සඵලදායකත්වයයි (4). මෙහෙයවීමයි

02. ව්‍යාපාරයට අදාළ අරමුණු තීරණය කිරීම, කළමනාකරණ කාර්යයන් අතුරින්,

(1). සැලසුම්කරණයට අයත් වේ (3). මෙහෙයවීමට අයත් වේ
(2). සංවිධානකරණයට අයත් වේ (4). පාලනයට අයත් වේ

03. සේවකයන් තම කාර්යය නිසි ලෙස ඉටුකිරීම සඳහා පෙළඹවීම,

(1). සැලසුම්කරණයයි (3). මෙහෙයවීමයි
(2). සංවිධානකරණයයි (4). පාලනයයි

04. අලෙවිකරණ මිශ්‍රයෙහි විචල්‍යයන් වනුයේ,

(1). නිෂ්පාදිතය, මිල, ස්ථානය, ප්‍රවර්ධනය
(2). තොග, සිල්ලර, මාධ්‍ය, මාර්ගය
(3). නිෂ්පාදිතය, මාධ්‍ය, මිල, ස්ථානය
(4). බෙදාහැරීම් ක්‍රම, මිල, මාධ්‍ය, ස්ථානය

05. ව්‍යාපාරයට වඩාත් ආකර්ෂණීය ලෙස මෙන්ම, ලාභදායීව තෘප්තිමත් කළ හැකි පාරිභෝගිකයන්ගෙන් සමන්විත වෙළඳපොළ,

(1). තොග වෙළෙඳපොළයි (3). සති වෙළෙඳපොළයි
(2). සිල්ලර වෙළෙඳපොළයි (4). ඉලක්ක වෙළෙඳපොළයි

06. අලෙවිකරණ මිශ්‍රයෙහි විචල්‍යයන් අතුරින් ව්‍යාපාරයට ආදායම් ලබා දෙන එකම විචල්‍යය වනුයේ,

(1). නිෂ්පාදිතයයි (3). ස්ථානයයි
(2). මිලයි (4). ප්‍රවර්ධනයයි

(ල. 1 × 6)

07. (1). ''කළමනාකරණය'' යන්න හඳුන්වන්න. (ල.2)

(2). සඵලදායකත්වය හඳුන්වන්න. (ල.2)

08. පහත ප්‍රකාශ සත්‍යද අසත්‍යද දක්වන්න.

(1). කළමනාකරණය කාර්යයන් රාශියකින් යුතු වූ ක්‍රියාවලියකි.

(2). යම් නිෂ්පාදිතයක් පාරිභෝගිකයා අතට පත් කිරීමෙන් අලෙවිකරණය අවසන් වේ.

(3). ගැනුම්කරුවන් හා විකුණුම්කරුවන් හමුවන නිශ්චිත ස්ථානයක් වෙළෙඳපොළක් ලෙස හැඳින්වේ.

(4). මහජන සම්බන්ධතා, අලෙවිකරණ මිශ්‍රයෙහි ස්ථානය යන විචල්‍යය යටතේ ඇති අයිතමයකි.

(ල.4)

09. (1). ''අලෙවිකරණය'' යන්න හඳුන්වන්න. (ල.2)

(2). අලෙවිකරණයට අයත් කාර්යයන් දෙකක් ලියා දක්වන්න. (ල.2)

10. නාලිනී හට එළඹෙන මාසයේදී විවාහ මංගල උත්සවයක් සඳහා සහභාගී වන ලෙසට ආරාධනාවක් ලැබී ඇති අතර ඇය විසින් ඒ සඳහා අවශ්‍ය ඇඳුම් මිලදී ගැනීම සඳහා නගරයේ ප්‍රසිද්ධ වෙළඳසැලකට පැමිණියාය. එහිදී එක් එක් ඇඳුම් මෝස්තරය හා ඒ සඳහා ලබා දෙන වට්ටම් හා ගෙවීම් ක්‍රම පිළිබඳව ඇය සැලකිලිමත් විය.

(1). ඉහත සිදුවීම් තුළදී ඇතුළත් වූ අලෙවිකරණ මිශ්‍රයේ පවතින විචල්‍යයන් දෙකක් ලියා දක්වන්න. (ල.1)

(2). ඔබ විසින් ඉදිරිපත් කළ එක් එක් විචල්‍යය යටතේ ඇති අයිතමයන් සඳහා උදාහරණය බැගින් ලියා දක්වන්න. (ල.2)

11. පහත දැක්වෙනුයේ ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු සිදුකරන RV කන්ස්ට්‍රක්ෂන් සමාගමේ සිදුකළ කාර්යයන් කිහිපයකි. එම කටයුතු කළමනාකරණ ක්‍රියාවලියෙහි කුමන කාර්යයට අයත් වේදැයි ලියා දක්වන්න.

A. ව්‍යාපාරයට නව කම්කරුවන් බඳවා ගැනීමට තීරණය කිරීම.

B. සිමෙන්ති කොට්ට දහසක් මිලදී ගැනීම.

C. අදාළ ගොඩනැගිල්ල ඉදිකිරීම නිසි ප්‍රමිතියට සිදුකර ඇති දැයි සොයා බැලීම.

D. සිමෙන්ති මිශ්‍ර කිරීමේ යන්ත්‍ර මිලදී ගැනීම.

(ල.4)

*සැකසුම : ඩී.එස්. චේතනා මිය*